SOEURS DE LA PROVIDENCE DE RUILLE SUR LOIR

Le Mans 9 avril dimanche des Rameaux

ආදර සොහොයුරියනි,

අද ගොබ් ඉරුදිනයි 'හෝසාන්නා' අපගේ සියළුම දේවස්ථාන ජනයාගෙන් පිරී ඇත. නිවෙස් කරා ගෙන ආ ගොක් කොළ කුරුසිය මත තබමින් ජේසුට ප්‍රකාශ කළේ එතුමාගෙන් අපට බලාපොරොත්තුව සහ ජීවිතය ලැබුණා බවයි.
ගොබ් ඉරුදින ජනවන්දනා පිළිවෙතේදී ආසිරූ ගැන්වු ගොක් කොළ අපට සිහිපත් කරන්නේ ශුද්ධවු සතියේ ආරම්භයයි.එය නව අනාගතයට බලාපොරොත්තු ඇති කරන සළකුණයි.

ශුද්ධවු සතියෙ මැද භාගයේදී මෙම ලිපිය කියවීමට ලැබෙයි. ක්‍රිස්තුස් වහන්සේගෙ ජීවිතයේ අවසාන දිනයන්ට ජනවන්දනාව තුළින් නැඹුරු වෙමු. මහා සිකුරා තොර පාස්කුවක් නැත. ශුඬවු සභාව මහා සිකුරාද ශෝක දිනයක් ලෙස නොව බලාපොරොත්තුවෙ දිනයක් ලෙස සමරනවා ඔබට හැඟුනාද? කුරුසය මත දිවි පිදීමෙන් ක්‍රිස්තුස් වහන්සේ මරණය ජයගත් බව පෙන්නුම් කරයි. කුරුසිය වේදනාවේ සහ මරණයේ සලකුණයි, එය බලාපොරොත්තුවේ, සතුටේ සංඛේථයයි. 'මුළු ලොවට සතුට කුරුසිය ගෙනා බව'ශුඬවු සිකුරාද ජනවන්දනා ඇන්ටිෆනයෙන් අපි සිහිපත් කරන්නෙමු.

**ඇන්සලම් ගෘඇන් මෙසේ පවසයිඃ**

දෑත්විහිද කුරුසය මත වැඩ සිටින ජෙසුතුමන් මුළු ලොවම ආවරණය කරයි.
කුරුසය අපගේ ජීවිත අභිරහස ප්‍රකාශ කරයි. ස්වර්ගය හා පොළෝතළ දෙවියන් හා මිනිස් සංහතිය, ජීවිතය හා මරණය, අඳුර හා ආලෝකය, එතුමන් එක්සත් කළහ. ජේසුතුමන් ගේ කුරුසය මෙනෙහි කිරීමෙන් ,අපට අපගෙ කුරුස දැකිය හැක. මේවා දෙස බැලිය යුත්තේ,භියෙන් සැකයෙන් තොර ආකල්පයෙනි. සැබැවින්ම ජීවිත හරා යන කුරුස මඟින් අප විනාශ නොවේ. 'කුරුසයෙන් සම්පූර්ණත්වයට පැමිණි පෙමය' අභිරහස්මත් ජේසු තුමන් වෙත අපගේ හදවත් විවෘත කරයි.

මහා සිකුරාද ජනවන්දනා පිළිවෙතින් පාස්කුවෙ ආලෝකය විනිවිද වේ. මරණය පරාජ කළ කුරිසිය, අපගේ වේදනාවන් ප්‍රේමයට හැරවීමේ සළකුණවේ. මෙම ශුඬවු දිනවල අපගේ හදවත් ප්‍රේමයෙන් , කෘතඥතාවයෙන්, සහා බලාපොරොත්තුවෙන් පිරී ඇත. ක්‍රිස්තු තුමන් ජීවමානයි ! අප අතරයි !

මුළු ලොව පුරා වේදනාවෙන් කල් ගෙවන අපගේ සොයුරු, සොයුරියන් සමඟ අපගේ වේදනාවන් සහා මරණයේ බීජයන් ස්වාමින් වහන්සේට පඬුරු කරමු. උ අනවු ක්‍රිස්තුන් මිනිස් වගීයාට දෝංකාර දෙන ජීවිත පණිවිඩය කාළයෙන් කාළයට අපට ඇරයුම් කරන්නේ , ද්‍රවීඥතාවයෙන් , සමාජීය නොකරණ ලෙසයි.

**ප්‍රැන්සිස් පාප්තුමන් මෙසේ කියයි :**

අපගේ සමාජයේ බලාපොරොත්තු කඩවූ, ජීවිතයේ මිහිර අහිමිවු, මහළුවුවන්, තනිකම අත්දකින, ශක්තිය හීනවූ, අනාගතයක් නැතයි සිතන මේ සියලුදෙනා වෙනුවෙන් දෙවිඳුන් යදිමු. උත්ථානවු ස්වාමින් වහන්සේගේ පණිවිඩය ලොවට ප්‍රකාශ කරමු. 'මම සියල්ල නවතාවයට පමුණුවන්නෙමි !' පිපාස වූවන්ට ජලය දෙමි, අය කිරීමෙන් තොරව ජීවන උල්පතින් ජලය දෙමි.' (එළිදරව්ව 21,5-6)

අප එකිනෙකාට අපගේ ජීවිත ගමනේ ඉදිරියට යාමටට ජේසුගේ පණිවිඩය ශක්තියක් වේ. අප දෙවියන් සහ

සොයුරු ,සොයුරියන් සමඟ සමගී වීමේ පාලම් තැනීමට අපට දිරිය  ලබා දේ.

විශ්වාසයේ ඇසින් ශුඬවු කුරුසය වෙත නෙත් යොමු කරමු. එවිට වේදනාව පමණක් අත් නොදකිමු. ජේසුගේ ආදරය මරණයට වඩා බලවත්ය. උ නයෙන් තොර මරණයක් නැත.නව ආරම්භයක් නැති අසමත් වීමක් නැත

කුරුසය වෙත නෙත් යොමන්න අප්‍රමාන ප්‍රේමයෙන් මුළු මිනිස් වගීයාවද, මාගේ සොහොයුරියන් වද, මාගේ පවුල ද,පිළි ගනිමි.

වසන්ත සමයේ ඇතිවන පිබිදීම, සුන්දර භාවය,පාස්කුව තේරුම් ගැනීමට අත්වැළක් වේ. මරණයේ ජයග්‍රහණය ස්වභාව  දහම තුළද පිළිඹිබු වේ. !

ජීවිතය මරණය ජය ගත් නිසා,  බලාපොරොත්තු වෙන් පිරුණු ශුඬවත් පාස්කුවක්,එකි නෙකාට ප්‍රාර්ථනා කරමි

මාර්ටින් මෙවසන් සොහොයුරිය,

සුපීරියර් ජෙනරල්

Sister Martine Mewrissa